# ව්‍යාපාර කළමණාකරණ කමිටු වාර්තාව 2019 පෙබරවාරි මාසය
# 2019 යල පෙර කන්න රැස්වීම - මිණිපේ මහා වාරිමාර්ග ව්‍යාපාරය.

- දිනය :- 2019/ 02/ 21
- ස්ථානය :- මිණිපේ ව්‍යාපාර කාර්යාලය
- වේලාව :- පෙ.ව. 10.00
- සහභාගිත්වය :- පැමිණීමේ ලේඛණය අමුණා ඇත.

සිරිත් පරිදි ආගම සිහිකිරිමෙන් අනතුරුව පිළිගැනිම හා අරමුණ පැහැදිලි කිරිම මිණිපේ නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමා විසින් සිදු කරන ලදි.

## අරමුණු

1.2019 යල පෙර කන්න රැස්වීම පිළිබද පෙර වගා තීන්දු තීරණ ගැනීම

2.මිණිපේ අමුණ ප්‍රධාන ඇල ව්‍යාපෘතිය පිළිබද මේ වන විට සංවර්ධන කටයුතු පිළිබද සාකච්ඡා කිරීම.

3.Crip ව්‍යාපෘතිය පිළිබද සාකච්ඡා කරීම.

4.peiseip ව්‍යාපෘතිය පිළිබද සාකච්චා කිරීම.

## ලිපි ඉදිරිපත් කිරීම

→ I පියවර ප්‍රා.ගො.සංවිධාන සභාපති විසින් නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමා වෙත යොමු කරන ලද ව්‍යාපාර කළ.කමිටු රැස්වීමේදී රාජ්‍ය නිලධාරින්ට පෙර ප්‍රාදේශීය ගොවි සංවිධාන සභාපතිවරුන්ට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන ලෙස 1 පියවර ප්‍රාදේශීය ගොවි සංවිධාන රැස්වීමේදී ගනු ලැබූ තීරණ පිළිබද ලිපිය.

→ " ගොවීන් විසින් දේශීය බඩ ඉරිගු අලෙවි කිරීම" සම්බන්ධයෙන් වාරි කලමනාකරණ අංශය මගින් යොමු කරන ලිපිය.

→ වාරි කළමනාකරණ අංශය මගින් යොමු කරන ලද 2018 සිරි දළදා යල් අස්වනු පූජාව සදහා ස්තූති පූර්වක ප්‍රණාම ලිපිය.

→ ප්‍රධාන ජලාශ ආශ්‍රිතව කරනු ලබන මහ පිරිත් සජ්ජායනාව පිළිබද වාරි කළමනාකරණ අංශය මගින් එවන ලද ලිපිය.

→ හසලක වැව පූර්ණ වශයෙන් ගොඩවීමට දායක වී ඇති රොන්මඩ සහ වැලි අපද්‍රව්‍ය ඉවත් කිරීම සම්බන්ධයෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය- මහනුවර යොමු කල ලිපිය.

→ 3 පියවර ඩී 42 ගො.සං. සභාපතිතුමා විසින් ඒ.ගො.සං. සභාපතිතුමා මගින් නේ.ව්‍යා.කළ.තුමාට යෙමුකරන ලද ඩී 40 ඇල, මීමාඔබේ වසමේ පදිංචි කේ.ඒ.මුතුබංඩා මහතා දැනට වසර 20 ක පමණ කාලයක සිට අක්.2ක් පමණ වාරි ජලයෙන් වගා කරන කුඹුරු ඉඩම සදහා බල පත්‍රයක් ලබා ගැනීම සම්බන්ධයෙන් වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ හා ව්‍යාපාර කමිටුවේ නිර්දේශය ලබා දෙන ලෙස කළ ඉල්ලීම් ලිපිය

| ඉදිරිපත්කරණ නිළධාරියා ආයතනය | කාරණය |
|---|---|
| නේ.ව්‍යා. කලමනාකරු | • ව්‍යාපාර කලමනාකරණ කමිටු රැස්වීම නියෝජනය කල යුත්තේ ගොවි සංවිධාන සභාපතිවරු බැවින් වෙන යම් ගොවි සංවිධාන නිලධාරියෙකු සම්බන්ධ වන්නේ නම් ඒ සම්බන්ධව ගොවි සංවිධාන සභාපතිගේ නිර්දේශය සහිත ලිපියකින් ඒ බව ව්‍යාපාර කලමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට පෙර ලබා දිය යුතු බවත්<br>• 1 පියවර ප්‍රාදේශීය ගොවි සංවිධාන සභාපතිගේ ඉල්ලීම පරිදි ප්‍රාදේශීය ගොවි සංවිධාන සදහා අදහස් දැක්වීමට මුලින්ම අවස්ථාව ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී. |
| 2 පියවර ආය.සං. නිලධාරි | • පෙර ව්‍යාපාර කමිටු රැස්වීමේදී ගොවි සංවිධාන තොරතුරු ලේඛනයක් ලබා දීමට කටයුතු කරන ලෙස පැවසුවද බොහෝ ගොවි සංවිධාන මගින් මේ වන තෙක් එම තොරතුරු ලබා දී නොමැති බවත් එය කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙසත්<br>• 2019 වර්ෂයේ සිට ඉදිරියට ගොවි සංවිධාන සැලසුම් හා ඉලක්ක පිළිබද ලේඛනය ලබා දෙන ලෙසද<br>• 2019 අදාල නිලවරණ මැයි මාසය තුල පැවැත්වීමට කටයුතු කරන ලෙසද<br>• සියලුම ගොවි සංවිධාන විසින් කන්න අතර මැද ඇලවේලි ශුද්ධ කිරීමක් කරන ලෙසත් දැනුම්වත් කරන ලදී. |

| | |
|---|---|
| 04 පියවර ප්‍රා.ගො.සං.සභාපති | • 4 පියවර ප්‍රා.ගො.සං.රැස්වීම පවත්වා 2019 යල කන්නය සඳහා පෙර වගා තීරණ ගනු ලැබූ බවත් ඒ අනුව 2018/19 මහ කන්න වගා කටයුතු මාර්තු මස මුල් කාලය වන විට අවසන් කිරීමට හැකි බවත් එබැවින් 2019 යල කන්නයට මාර්තු 20 වන විට ජලය ලබා දීමට කටයුතු කරන ලෙසත්<br>• මේ වන විටත් ප්‍රධාන ඇලට ගල් ලොඩ් 04ක් පමණ පතිත කර ඇති බවත් 2019 යල කන්නය සඳහා ජලය නිකුත් කරන විටත් එම ගල් ඒ ලෙස පවතින්නේ නම් 04 පියවර අවසානය දක්වා ජලය ගෙන යාමට නොහැකි බැවින් කඩිනමින් එය ඉවත් කිරීමට කටයුතු කරන ලෙසත්<br>• දුනුවිල වැවේ ජලය විශාල ප්‍රමාණයක් අපතේ යන බවත් ඊට විසඳුම් ලබා දීමට කටයුතු කරන ලෙසත්.<br>• ගාමිණී කොන්ත්‍රාත් සමාගම විසින් සිදු කරන ලද සංවර්ධන කටයුතු සාර්ථක මට්ටමේ නොමැති බවත් මේ වන විට එක් එක් පාර්ශව තවත් පාර්ශවයන්ට එම වගකීම පවරන නමුත් ඊට වගකියන කිසිවෙකුත් නොමැති වීම කණගාටුවට හේතුවන බවත්<br>• 2019 යලකන්නයට පෙර කෙසේ හෝ මෙම සංවර්ධන කටයුතු අවසන් කර ගොවි ජනතාවට වගා කටයුතු සිදු කර ගැනීමට අවස්ථාව ලබා දිය යුතු බවත්<br>• මේ වන විට ගොයමට කීඩැ රෝගය පැතිර ගොස් ඇති බවත් ඒ පිළිබඳව ද වගකිව යුතු අයගේ අවධානය යොමු නොවීම ගොවියාට කරන අවැඩක් බවත්<br>• මාර්තු මාසය වන විට අස්වනු නෙලීම ආරම්භ කරන බවත් වී මිල මේ වන විට රු 28.00ක් වැනි පහළ මට්ටමක ඇති බැවින් එම මිල ප්‍රමාණවත් නොවන නිසා ස්ථාවර මිලක් යටතේ වී මිලදී ගැනීම් කටයුතු සිදු කිරීමට කටයුතු කරන ලෙසත්<br>• හෙට්ටිපොල ඉන්මාස් ශාලාව මේ වන විට ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බැවින් එය ප්‍රතිසංස්කරණය කිරීමට අවධානය යොමු කරන ලෙසත්<br>• කෘෂි පාරවල් සකස් කිරීමේදී අවශ්‍ය පස් ලබා ගැනීම හා ප්‍රවාහනය කිරීමේදී යම් යම් සීමා පවතින බැවින් අදාල ආයතනවලින් සහයෝගය ලබා දීමට කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී. |
| 03 පියවර ප්‍රා.ගො.සං.සභාපති | • 3 පියවර ප්‍රා.ගො.සං.සභාපති රැස්වීම පැවැත්වූ බවත් එහිදී 2019 යල කන්නය සඳහා පෙර වගා තීරණ ගනු ලැබූ බවත් 2018/19 මහ කන්නය වගා කටයුතු මාර්තු මස 15-20 වන විට අවසන් කළ හැකි බැවින් 2019 යල කන්නය සඳහා 2019 මාර්තු මස 25 දින 3 පියවර 2019 යල වගා කටයුතු සඳහා ජලය ලබා දීම සුදුසු බවත්<br>• යල කන්නය සඳහ පොහොර ලබා දීම කලට වේලාවට සිදු කර කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙසත්<br>• යල කන්නය අතුරු බෝග සඳහා බීජ ලබා දීමට කටයුතු කරන ලෙසත් ඒවා කඩිනමින් ලබා දෙන ලෙසත්<br>• රදුන්න ,මාරක ,ඩී47 ,අලුත් වැව ,මල්ගම්මන ආදී 3 පියවර තුල ඇති වැව් 08ක් ජලජ පැලෑටි හා රොන්මඩවලින් පිරී ඇති බැවින් ඒවා ඉවත් කර වැව්වල ජලය රඳවා ගත හැකි ආකාරයට පිළිසකර කර දෙන ලෙසත්<br>• බෝගහ වැව පිටවාන ඉදිරියෙන් විශාල උමගයක් ඇති බවත් ඒ බැවින් ජලය විශාල ලෙස අපතේ යන බැවින් එය සකස් කර දෙන ලෙසත්<br>• මාරක වැව හා රදුන්න අතර ඇති කොටස සංවර්ධන කටයුතු මේ වන තෙක් අවසන් කර නොමැති බවත් යල කන්නය ආරම්භයට පෙර එය සකස් කර දෙන ලෙසත්<br>• පැල මැක්කා හා කෘමි උවදුරු මේ වන විට වගාවන් සඳහා ව්‍යාප්තව ඇති නමුත් ඒ සඳහා අවශ්‍ය උපදෙස් නොලැබීම කණගාටුවට හේතුවක් බවත්<br>• වන සතුන්ගෙන් වගාවට වන හානිය මේ වන විට උග්‍ර වෙමින් පවතින බවත්<br>• වී මිල සම්බන්ධව ගොවීන්ගේ අප්‍රසාදය පල කරන බවත් ස්ථාවර මිලකට වී මිලදී ගැනීම සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි. |
| 1 පියවර ප්‍රා.ගො.සං.සභාපති | • ඩී 43 ගොවි සංවිධාන බල ප්‍රදේශය රක්ෂිත සීමාව තුල ඉදිකෙරෙමින් පවතින අනවසර ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ඩී 43 ගොවි සංවිධානයට මහත් ගැටළුවකට මුහුණ පෑමට සිදුව ඇති බවත් එම ගොවි සංවිධාන සභාපතිතුමා ප්‍රාදේශීය ගොවි සංවිධාන රැස්වීමේදී ඒ පිළිබඳ ඉතාමත් කණගාටුවෙන් කතා කළ බවත් ඊට කිසිදු රාජ්‍ය නිලධාරින්ගේ මැදිහත් වීමක් සිදු නොවීම සභාපතිතුමා ඇතුළු ගොවි කණ්ඩායම අසරණ භාවයට පත්වීමක් බවත්,මේ වන විට අධිකරණ නඩු විභාගයකට පවා ඩී 43 ගොවි සංවිධාන සභාපතිතුමාට මුහුණු දීමට සිදුව ඇති බවත්.<br>• Crip ව්‍යාපෘතිය පිළිබඳ අදහස් දක්වමින් ව්‍යාපෘතිය ආරම්භක අවස්ථාවේ පැවති උද්‍යෝගිලී භාවය ව්‍යාපෘතිය පටන් ගැනීමත් සමග අතුරුදන් වූ බවත් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විශාල ගැටළු ප්‍රමාණයක් උද්ගතව ඇති බවත්<br>• 2018/19 මහ කන්න රැස්වීමේදී දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රකාශය සිහිගන්වමින් කියා සිටියේ 2018/19 මහ කන්නය අතහැර Crip ව්‍යාපෘතිය සංවර්ධන කටයුතු සඳහා අවස්ථාව ලබා දීමත් එහි සංවර්ධන කටයුතු අදාල කාලසීමාව තුල අවසන් කිරීමත් එසේ අදාල කාලසීමාව තුල එම සංවර්ධන කටයුතු සිදු නොකරන්නේ නම් එම කොන්ත්‍රාත්කරුවන් සඳහා ප්‍රතිපාදන නොගෙවන ලෙසත් කළ ප්‍රකාශය මේ වන විට කොතරම් දුරට ක්‍රියාත්මක වන්නේද යන්නත් 2019 යල කන්නය වගා කටයුතු සිදු කිරීමට එම සංවර්ධන කටයුතු කිසිසේත් බාධාවක් නොවිය යුතු බවත් |

| | |
|---|---|
| | • Crip ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ ඇලවල්වල ගැටළු පරීක්ෂා කිරීම සඳහා නැවත ස්ථානීය පරීක්ෂාවක් කරන ලෙසද<br>• ඩී 47,49 ඇලවල් වල මුර ජල ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේදී එම ඇලවල්වල මුලින් ජලය පිටාර ගලා යන බවත්,<br>• පොහොර ප්‍රවාහන මුදල් පිළිබඳ විවිධ ගැටළු පවතින බවත් එහි නිවැරදි කර අදාල මුදල නැවත ගොවි සංවිධාන වෙත ලබා දෙන බව ප්‍රා.ගොවිජන සංවර්ධන නිලධාරිතුමා පසුගිය ව්‍යාපාර කමිටු රැස්වීමේදී ප්‍රකාශ කල නමුත් එය එසේ සිදු නොවීම පිළිබඳ කණගාටු වන අතර ඊට අවධානය යොමු කොට අදාල මුදල් නැවත ගොවි සංවිධාන වෙත ලබා දීමට කටයුතු කරන ලෙසත්<br>• Peiseip ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී එහි සංවර්ධන කටයුතු ගොවි සංවිධාන වෙත ලබාදීම යහපත් බවත් නමුත් යම් හෙයකින් රු ලක්ෂ 50 ඉක්මවා එම සංවර්ධන කටයුතු සිදු වන්නේ නම් එම සංවර්ධන කටයුතු ගොවි සංවිධාන තුළින් ගිලිහී යන බැවින් සංවර්ධන කටයුතු කොටස් කර හෝ අධියර යටතේ සිදු කිරීමට ගොවි සංවිධාන වෙතට එම කොන්ත්‍රාත් ලබා දීමට කටයුතු කරන ලෙසත්<br>• 2019 යල කන්නය සඳහා මුල් ජල මුරය 2019/04/25 දින ලබා දීමට කටයුතු කරන ලෙසත්<br>• 2018 /19 මහ කන්නය සඳහා අවසන් ජල මුරය මාර්තු 15 දින දක්වා දීර්ඝ කර දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී. |
| 2 පියවර ප්‍රා.ගො.සං.සභා පති | • 2 පියවර ප්‍රා.ගො.සං රැස්වීම පැවැත්වූ බවත් එහිදී 2019 යල කන්නය සඳහා පෙර වගා තීරණ ගනු ලැබූ බවත්,ඒ අනුව ප්‍රථම ජල මුරය අප්‍රේල් 20-25 කාලය තුල ලබා දෙන ලෙසත්<br>• ඩී 43 රක්ෂිත සම්බන්ධ ගැටළුව පිළිබඳ කෘෂිකර්ම කමිටු රැස්වීම් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වලදී දැනුවත් කර ඇති බවත්<br>• Crip ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු පිළිබඳ මේ වන විට තත්වය හා ඉදිරියේදී එම ගැටළුවලට මුහුණ පෑමට සිදුවන ආකාරය පිළිබඳවත්,<br>• හසලක වැව රොන්මඩ ඉවත් කිරීම පිළිබඳවත් එම කටයුතු වෙනත් සමාගම් හෝ පුද්ගලයන්ය භාර නොදී ඒ ගොවි සංවිධාන ලබා දීමට කටයුතු කරන ලෙසත්<br>• කීඩෑ හානිය මේ වන විට වගාවන් සඳහා පැතිර ගොස් ඇති බවත් ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කල යුතු බවත්,ප්‍රකාශ කරන ලදී.<br>• II පියවර D40 ඇල කේ.ඒ.මුතුබණ්ඩා මහතා විසින් වසර 20ක් පුරාවට වාරි ජලයෙන් වගා කටයුතු සිදු කර අක්කර 02ක පමණ කුඹුරු ඉඩම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.<br><br>හසලක වැව රොන්මඩ ඉවත් කිරීමේ ක්‍රියාදාමය ඒකාබද්ධ ගොවි සංවිධාන හරහා සිදු කිරීම සුදුසු බව 2 පියවර ඩී 07 සභාපති මහතා යෝජනා කල අතර 2 පියවර ඩී 34 ගොවි සංවිධාන සභාපති මහතා ස්ථිර කරන ලදී |
| රන්දීප ඇග්‍රියන් පුද්ගලික සමාගමේ කළමනාකරු | • රන්දීප කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ බෙදා හැරීමේ පුද්ගලික සමාගම පිළිබඳ හැඳින්වීමක් සිදු කරමින් ගොවි සංවිධාන අතර පැවැත්වීමට නියමිත වොලිබෝල් තරගාවලිය මාර්තු මාසයෙන් පසු පැවැත්වීමට කටයුතු කරන බවත් එබැවින් සෑම ගොවි සංවිධානයක් විසින්ම එම ඉල්ලුම්පත් සම්පූර්ණ කොට ලබා දීමට කටයුතු කරන ලෙසත්<br>• ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික වශයෙන් පවත්වනු ලබන ගොවි සංවිධාන තරග සඳහා 1,2,3 ස්ථාන වලට ලබ දෙන ත්‍යාග රන්දීප සමාගම විසින් ලබා දීමට කටයුතු කරන බවත් සියලුම ගොවි සංවිධාන රන්දීප සමාගමේ ලියාපදිංචි වන ලෙසත්<br>• ඉදිරියේදී ගොවි සංවිධාන විසින් වප් මගුලක් ක්‍රියාත්මක කරන්නේ නම් ඊට දායකත්වය ලබා දීමට සූදානම් බවත් ප්‍රකාශ කරන ලදී. |

| | |
|---|---|
| ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු | • 2018/19 කන්නය සදහා මාර්තු 10 දක්වා ජල මුරය දීර්ඝ කර දෙන ලෙස කල ඉල්ලීම පිළිබද සලකා බලන බවත්<br>• 2019 යල කන්නය සදහා මුල් වරට ජලය නිකුත් කිරීම<br>3/4 පියවර සදහා -3/25<br>1/2 පියවර සදහා - 4/25 ලෙස ප්‍රාදේශීය ගොවි සංවිධානවලින් යොජනා වූ දින අනුව ඉදිරියේදී කන්න තීරණ ගත හැකි බවත්<br>• හසලක වැව රොන්මඩ ඉවත් කිරීම ඉදිරියේදී සිදු වන බවත් රොන් මඩ ඉවත් කිරීමෙන් පසු මඩ සොරොව්ව සකස් කිරීමේ හැකියාව ඇති බවත්<br>• වාරිමාර්ග ක්ෂේත්‍රය තුල රොන්මඩ ඉවත් කිරීම් සිදු විය යුතු නම් ඊට අනුමැතිය දීමට පසුබට නොවන බවත්<br>• කොන්ත්‍රාත් සමාගම් පිළිබද ගැටළුකාරි තත්වයන් පවතින බවත් එම ගැටළු මගහරවා ගෙන සංවර්ධන කටයුතු නිවැරදිව සිදු කිරීමට උත්සහ දරණ බවත්<br>• චෝදනා ,විවේචන සියල්ල තුළ සියලු දෙනාගේ සහයෝගය තුලින් එක්ව සියලු කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවත්<br>• Peiseip ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට නියමිත කෙත් ඇල මැනීම් කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිත බැවින් අදාල ගොවි සංවිධාන ඊට සහයෝගය දක්වන ලෙසත්<br>• 2018 වර්ෂයේ සංවර්ධන කරන ලද කෙත් ඇලවල් සදහා හිග මුදල් මේ වන විට ලැබී ඇති බවත් ඒවා ලබා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී. |
| | 3 පියවර ඩී 40 ඇල මීබාඔබේ පදිංචි කේ.ඒ. මුතුබංඩා මහතා විසින් වසර 20ක් පමණ කාලයක සිට අක්. 2ක් පමණ වන කුඹුරු ඉඩම මහා වාරි ජලයෙන් වගා කරන බවට වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ නිර්දේශය ලැබෙන බව ප්‍රකාශ වූ අතර එම ඉඩම සදහා බලපත්‍රයක් ලබා ගැනීම සුදුස බවට ව්‍යාපාර කමිටු කමිටුවෙ අනුමැතිය ද ලැබෙන ලදි. |
| 2 පියවර ප්‍රාදේශීය ගොවිජන සං.නිලධාරි | • වී මිලදී ගැනීම සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්තුමාගේ මැදිහත් වීමෙන් සාකච්ඡාවක් පැවැත්වෙන බවත් එහිදී වී මිල පිළිබද තීන්දු තීරණ ගනු ලබන බවත්,<br>• දැනට පොහොර ලේබන ලබාගෙන ඇති අතර එම ලේබන වලට අනුව වී ගබඩා වලින් වී මිලදී ගැනීම් සිදුවෙන බවත්<br>• 2019 යල කන්නය සදහා අතුරු භෝග වගාවන් වලට ඉරිගු වගා කිරීමට බලාපොරොත්තු වන්නේ නම් සේනා දළඹුවා පිළිබද පැවති අවධානම පහව ගොස් ඇති බැවින් ඉරිගු වගා කිරීමට සැක සංකා ඇති කර නොගන්නා ලෙස පවසන ලදී. |
| මිණිපේ ප්‍රධාන ඇල අමුණ ඉස්සීමේ ව්‍යාපෘතිය-නියෝජ්‍ය අධ්‍යක්ෂ | • මිණිපේ ඇල සංවර්ධන කටයුතු මේ වන විට විශාල ලෙස අවසන් කර ඇති බවත්<br>• 2019 පෙර කන්න තීරණ වලට අනුව වගා කටයුතු සිදු වන්නේ නම් 1,2 පියවර සදහා මාසයක කාලයකින් පසු කිරීම සංවර්ධන කටයුතු වලට බාධාවක් බවත් පියවර අතර කාල පරතරය වැඩි බවත් ප්‍රකාශ කරන ලදි., |
| නියෝජ්‍යය කෘෂි අධ්‍යක්ෂ | • බිත්තර බීජ වී සුළු ප්‍රමාණයක් ලබා දිමේ හැකියාව පවතින බවත්<br>• වන සතුන්ගෙන් වන හානිවලට විසඳුමක් ලෙස විදුලි පබයා 50% ක දායකත්වය යටතේ සකස්කර ගැනීමට හැකියාව පවතින බවත්,<br>• මේ වන විට කීඩැ හානිය පැතිරෙමින් පවතින බැවින් සියලු දෙනා ඒ පිළිබද අවධානයෙන් සිටින ලෙසත්<br>• 2019 යල කන්න සදහා පෙර කන්න තීරණම ක්‍රියාත්මක වන්නේ නම් 1,2 හා 3,4 පියවරයන් අතර කාලය වැඩි බැවින් අදාල කාල සීමාව තුලම සියලු දෙනාම වගා කටයුතු ආරම්භ කරන ලෙසත් ,එසේ නොවුනහොත් කෘෂි හානිවලට ගොදුරු වීමේ අවධානය වැඩි බවත්.<br>• මේ වන විට වගාව පූදින තත්ත්වයේ පවතින බැවින් වගාව සදහා ජලය වැඩි ප්‍රමාණයක් තිබිය යුතු නමුත් මුර ජල ක්‍රමයක් ක්‍රියාත්මක වන බැවින් ඊට අවස්ථාව ගිලිහී යන බවත්, ජල මුරය ක්‍රියාත්මක වන දින අතර කාලය අවම කර දෙන ලෙස වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් ඉල්ලීමක් සිදු කරන ලදී.<br>• 2019 යල කන්නයේ දී අතිරේක භෝග වගාවන් සදහා අනිවාර්යෙන්ම යොමුවන ලෙසත්<br>• 2019 යල කන්නයට මහනුවර දිස්ත්‍රික්කය තුල අක්කර 600ක් සදහා අතිරේක භෝග වගා කිරීම සදහා මුං,කව්පි,ඉරිගු යන බීජ ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. |
| 3 පියවර ප්‍රා.ගොවිජන.සං .නිල | • පොහොර පරිහරණ මුදල් පිළිබද සියලු වගකීම් ගො.සං විසින් සිදු කල යුතු බවත් කෘ.ප.නි.ස මහතා ඒ සම්බන්ධ කිසිදු ගනුදෙනුවකට සම්බන්ධ කර නොගන්නා ලෙසත්<br>• පොහොර සම්බන්ධ අයතා කටයුතු සිදුවී ඇත්නම් නීත්‍යානුකූලව කටයුතු කිරීමේ හැකියාව ඇති බවත් ප්‍රකාශ කරන ලදි. |
| ප්‍රා.ලේ.කාර්.සැලසුම් අධ්‍යක්ෂ | • වී මිලදී ගැනීම සම්බන්ධව 2019/2/23 වන දින දිස්ත්‍රික් ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් හසලක ප්‍රා.ලේ කාර්යාලයේදී සියලු ආයතන වල නිලධාරින්ගේ සහභාගිත්වයෙන් සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත බවත් |

<table>
<tr><td></td><td>

- වන සතුන්ගෙන් වන හානිය පිළිබදව කෘෂිකර්ම කමිටු රැස්වීමේදී සාකච්ඡා කිරීමට කටයුතු යොදන බවත් ප්‍රකාශ කරන ලදී.

</td></tr>
<tr><td>නේ.ව්‍යා.කළ මනාකරු</td><td>

- Peiseip ව්‍යාපෘතිය හරහා 1 පියවර ඩී 24,ඩී 35, 2 පියවර ඩී 25,ඩී 28/29 හා 3 පියවර ඩී 52 ගොවි සංවිධානවල කෙත් ඇල සංවර්ධන කටයුතු ඉදිරියේදී සිදු කරන බවත් ඒ සදහා jap වැඩ සටහන් සිදු කිරීමට නියමිත බවත් ප්‍රකාශ කරන ලදී.
- Crip ව්‍යාපෘතිය සංවර්ධන කටයුතු සම්බන්ධව මේ වන විට විවිධ ගැටළු පවතින බැවි සභාපතිවරු පැවසූ බැවින් සියලුම කොන්ත්‍රාත් සමාගම් සම්බන්ධ කර ගනිමින් ගොවි සංවිධාන සභාපතිවරුන් සදහා සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කරන ලෙසත් එම සංවර්ධන කටයුතු සිදු වූ ඇලවල් ස්ථානීය පරීක්ෂාවක් කිරීමට කටයුතු කරන ලෙසත්
- ගොවි සංවිධාන පිළිබද තොරතුරු ලේඛනය කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලෙසත්
- ඉදිරියේදී ගොවි සංවිධාන තරගාවලිවය පැවැත්වීම සදහා ගොවි සංවිධාන තේරීම් කටයුතු සිදු කරන බවත් ඒ අනුව මිණිපේ ව්‍යාපාර තුලින් ගොවි සංවිධාන 05ක් තෝරා ගනු ලබන අතර දිස්ත්‍රික් වශයෙන් ගොවි සංවිධාන 02ක් තෝරා ගනු ලබන බවත් පසුව ජාතික වශයෙන් තෝරා ගනු ලබන ගොවි සංවිධාන සදහා විශේෂ ත්‍යාග ක්‍රමයක් ඇති බවත්
- ප්‍රා.ගො.සං 4 හි අදහස් හා රාජ්‍ය නිලධාරින්ගේ අදහස් සලකා බලා පහත සදහන් පරිදි 2019 යල කන්නය සදහා පෙර වගා තීරණ ගනු ලබන බවත් ප්‍රකාශ කරන ලදී.

<table>
<tr><td>කරුණ</td><td>1පියවර</td><td>2 පියවර</td><td>3 පියවර</td><td>4 පියවර</td></tr>
<tr><td>වගා කරන බිම් ප්‍රමාණය (අක්කර )</td><td>5643</td><td>4819</td><td>3482</td><td>2668</td></tr>
<tr><td></td><td colspan="4">වී මාස</td></tr>
<tr><td>වී හා වෙනත් බෝග</td><td colspan="4"></td></tr>
<tr><td>මුල් වරට ජලය නිකුත් කළ යුතු දිනය</td><td colspan="2">4/18</td><td colspan="2">3/25</td></tr>
<tr><td>ඇල සුද්ද කර අවසන් කල යුතු දිනය</td><td colspan="2">4/10ට පෙර</td><td colspan="2">3/20</td></tr>
<tr><td>බිම් සැකසීම ආරම්භ කල යුතු දිනය</td><td colspan="2">4/18</td><td colspan="2">3/25</td></tr>
<tr><td>බීජ/ පැල සිටුවා හෝ වපුරා අවසන් කළ යුතු දිනය</td><td colspan="2">5/03</td><td colspan="2">4/10</td></tr>
<tr><td>මුර ජලය නිකුත් කිරීම</td><td colspan="2">5/18</td><td colspan="2">4/25</td></tr>
<tr><td>අවසන් ජල මුරය නිකුත් කිරීම (වී සදහා)</td><td colspan="2">8/03</td><td colspan="2">7/10</td></tr>
<tr><td>අස්වනු නෙලා අවසන් කල යුතු දිනය</td><td colspan="2">9/03</td><td colspan="2">8/10</td></tr>
<tr><td>රක්ෂණය කළ යුතු අවසන් දිනය</td><td colspan="2">5/3 ට පෙර</td><td colspan="2">4/10ට පෙර</td></tr>
<tr><td></td><td colspan="2"></td><td colspan="2"></td></tr>
</table>

ඒ අනුව 2019 යල කන්නය සදහා ඉදිරිපත් වූ පෙර වගා තීරණ සුදුසු බව 4 පියවර ප්‍රා.ගො.සං. සභාපති විසින් යෝජනා කළ අතර 3 පියවර ඩී 4 ගො.සං. සභාපති විසින් ස්ථිර කරන ලදී.

</td></tr>
<tr><td>ව්‍යාපාර කමිටු ලේකම්</td><td>

- පෙර කන්න රැස්වීම සදහා පැමිණි සියලුම රාජ්‍ය නිළධාරීන්ට හා සියළුම ගොවි සංවිධාන නිළධාරින්ට ස්තුතිය ප්‍රකාශ කරන ලදී.

</td></tr>
</table>



එම්. ඒ. බී. බණ්ඩාර
නේවාසික ව්‍යාපෘති කළමණාකරු
වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය
නේවාසික ව්‍යාපෘති කළමණාකරණ කාර්යාලය
මොරයාය, මිනිපේ

# පෙර කන්න තීරණ 2019 යල කන්නය - මිණිපේ ව්‍යාපාරය.

| කරුණ | 1පියවර | 2 පියවර | 3 පියවර | 4 පියවර |
|---|---|---|---|---|
| වගා කරන බිම් ප්‍රමාණය (අක්කර ) | 5643 | 4819 | 3482 | 2668 |
| | වි මාස | | | |
| වී හා වෙනත් බෝග | | | | |
| මුල් වරට ජලය නිකුත් කළ යුතු දිනය | 4/18 | | 3/25 | |
| ඇල සුද්ද කර අවසන් කල යුතු දිනය | 4/10ට පෙර | | 3/20 | |
| බිම් සැකසීම ආරම්භ කල යුතු දිනය | 4/18 | | 3/25 | |
| බීජ/ පැල සිටුවා හෝ වපුරා අවසන් කළ යුතු දිනය | 5/03 | | 4/10 | |
| මුර ජලය නිකුත් කිරීම | 5/18 | | 4/25 | |
| අවසන් ජල මුරය නිකුත් කිරීම (වී සදහා) | 8/03 | | 7/10 | |
| අස්වනු නෙලා අවසන් කල යුතු දිනය | 9/03 | | 8/10 | |
| රක්ෂණය කළ යුතු අවසන් දිනය | 5/3 ට පෙර | | 4/10ට පෙර | |

## 1994 අංක 13 දරණ වාරිමාර්ග පනතින් සංශෝධිත 5 වගන්තියේ 6 වන උප වගන්තිය ප්‍රකාරව පවත්වන පෙර වගා රැස්වීමට අදාල සකස් කර ගන්නා රීති

1. කෙත් ඇලවල්වල හා බෙදුම් ඇලවල්වල නඩත්තුව සදහා අක්කර 01 කට රුපියල් 200 ක් ගොවි සංවිධාන විසින් අය කිරිම.

2. ජලය සොරා ගන්නන් සහ වාරි පද්ධතියට හානි කරන්නන් සදහා වාරිමාර්ග දෙපාර්තමේන්තු තක්සේරුවට අනුව දඩ අය කිරීම.

3. නියමිත දිනයට කෙත් ඇල සහ බෙදුම් ඇල පද්ධතිය (තම කොටස) සුද්ධ නොකරන ගොවීන් සදහා දුර 20mක් සදහා රු 1000 .00 ක් හා ඊට වැඩි වන සෑම මීටරයකටම රු 50/=ක් ලෙස දඩ අයකරනු ලබන අතර, නොගෙවන්නේ නම් සමත මණ්ඩලය මගින් දඩය අය කර ගැනීම.

4. පොහොර ලේඛනය නිර්දේශ කිරීමේ දී ඇල පද්ධතිය ශුද්ධ නොකරන ගොවීන් සදහා සාමාජිකත්වය තහවුරු නොකිරීම

5. වෙනත් - අක්කරයක් සදහා කොම්පොස්ට් පොහොර කිලෝ 2000 ක් යෙදීම අනිවාර්ය වේ.

* රක්ෂිත වගාකිරීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීම. (ප්‍රධාන ඇල, බෙදුම් ඇල, කෙත්ඇල)

.

# 2019 යල පෙර කන්න රැස්වීම - මිණිපේ ව්‍යාපාරය

## රාජ්‍ය නිලධාරින්ගේ පැමිණීමේ අත්සන් ලේඛනය - 2019/ 02/ 21

| අඅ | නම | ආයතනය | තනතුර |
|---|---|---|---|
| 1. | M.A.D. බණ්ඩාර මයා | වාරි.කල. අංශය | නේ. ව්‍යා. කළමනාකරු |
| 2. | පාලිත රජපක්ෂ | ප්‍රා.ලේ.කාර්.හසලක | ස.අධ්‍යක්ෂ |
| 3. | M.J.M කලීල් මයා | අමුණ ඉස්සීමේ ව්‍යාපෘතිය | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| 4. | ඩබ්.එස්.සී ඒකනායක | වාරි. දෙ | කොට්ඨාස සහකාර |
| 5. | අයි.කේ.ඩබ්.ඒ.සමරජීව | ප්‍රා.නිළධාරි | හසලක |
| 6. | පී.ජී.එන්.කේ.ගුණරත්න | ගො.සං.දෙ-උල්පතගම | ගොවි. සං. ප්‍රා. නිළධාරී |
| 7 | කේ.ටී.ආර්.ප්‍රේමදාස | වාරි .කල.අංශය | ආයතන සං. නිලධාරි |
| 8 | එම්.එම්.ඒ.පී.තිලකරත්න බංඩා | එම | සං.සහකාර |
| 9 | ඩී.එම්.රුවන් ප්‍රසාද් | එම | සං.නිලධාරි |
| 10 | ඩී.පී.ජේ.එන්.කුමාරි | එම | එම |
| 11 | එච්.එම්.සී.කේ.හේරත් | එම | එම |
| 12 | ඊ.ඒ.එන්.ඩී එදිරිසිංහ | වාරි.දෙ | ඉංජි.සහකාර -1 පියවර |
| 13 | එල්.ජී.බී.පී.එන් බණ්ඩාර | වාරි.දෙ | ඉංජි.සහකාර -1 පියවර |
| 14. | එම්.ජී.රූපසිංහ | එම | ඉංජි.සහකාර -2 පියවර |
| 15 | ජී.පී.එස්.කණුෂ්ක | එම | ඉංජි.සහකාර |
| 16 | යූ.ආර්.එස්.බී.අයි.ඉලංගතිලක | එම | එම |
| 17 | ඒ.එම්.ආර්.ඩී.අතපත්තු වෙනුවට(ක්ෂේත්‍ර සහකාර) | එම | ඉංජි.සහකාර -3 පියවර |
| 18 | බී.කේ.ඒ.නිරෝෂන් | එම | ඉංජි.සහකාර -4 පියවර |
| 19 | එන්.එස්.මෙන්ඩිස් | ප්‍රා.සං.බැංකුව, මොරයාය | කළමනාකරු |
| 20 | ජී.පී.කරුණාරත්න | වනජීවි කාර්යාලය-හසලක | වනසත්ව අඩවි සහකාර |
| 21 | පී.ඩී.එස්.එන්.ගුණතිලක | කෘෂි.දෙ | මූ. කෘෂි.උපදේශක,මොරයාය |
| 22 | ඩබ්.එම්.පී.ජී.එන්.යූ.වාසල | කෘෂි.දෙ | මූ. කෘෂි.උපදේශක,මොරයාය |
| 23 | එම්.කේ.ටී.මහේන්ද්‍රන් | එම | මූ. කෘෂි. උපදේශක, උල්පතගම |
| 24 | ඩබ්.පී.කේ.ප්‍රදීප් විජේසේකර | එම | කෘෂි උපදේෂක- හෙට්ටිපොල |

# ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම  - මිණිපේ ව්‍යාපාරය

## ගොවි සංවිධාන නිලධාරින්ගේ පැමිණීමේ අත්සන් ලේඛනය - 2019/ 02/ 21

## 1 පියවර

| අඅ | නම | ගො.සං | තනතුර |
|---|---|---|---|
| 1. | වයි.එම්.ඩබ්.ජී.බිසෝමැණිකේ මිය | ඩී 01 | සභාපති |
| 2. | ඩබ්.එම්.කේ.ජී.අබේරත්න මයා | ඩී 8 | සභාපති |
| 3. | ඒ.ඩබ්.ඒකනායක මයා | ඩී 21 | සභාපති |
| 4. | කේ.ජී. ධර්මදාස මයා, | ඩී 24 | සභාපති |
| 5. | එච්.එම්.ඥානවිමල මයා, | ඩී 25 | සභාපති |
| 6. | සී.බී.මාරසිංහ මයා | ඩී 26 | සභාපති |
| 7. | ජී.ජී.ජිනදාස මයා | ඩ 31 | සභාපති |
| 8. | ඩී.එම්.ඒ.නවරත්න මයා | ඩී 32 | සභාපති |
| 9. | ආර්.එම්.ගාමිණි පියතිස්ස | ඩී 34 | සභාපති |
| 10. | එස්.එම්. අබේරත්න මයා, | ඩී 39 | සභාපති |
| 11. | ආර් .එම්. ජයවර්ධන මයා, | ඩී 41 | සභාපති |
| 12. | ඒ.එම්. ධර්මසේන මයා, | ඩී 43 | සභාපති |
| 13. | ඒ.එම්.ඩබ්. සෙනවිරත්න මයා, | ඩී 45 | සභාපති |
| 14. | එම්.ජී. ජයවර්ධන මයා, | ඩී 49 | සභාපති |

**2 පියවර**

| අඅ | නම | ගො.සං | තනතුර |
|---|---|---|---|
| 15 | රංජිත් තිලකරත්න | ඩී 1 | ලේඛම් |
| 16 | එස්.ඒ.ඩබ්.ඒ.ජයරත්න | ඩී 2 | සභාපති |
| 17 | වයි.එම්.පොඩි නිලමේ | ඩී 4 | සභාපති |
| 18 | සී. රාජකරුණා  මයා, | ඩී 7 | සභාපති |
| 19 | ජේ.එම්.කේ.ජී. විජේරත්න මයා, | ඩී 11 | සභාපති |
| 20 | ආර්.ජී ජයරත්න මයා | ඩී 12 | සභාපති |
| 21 | ඩබ්.ජී. වාලි මයා | ඩී 17 | සභාපති |
| 22 | ඩබ්.පී.සෙනෙවිරත්න මයා | ඩී 18 | සභාපති |
| 23 | ඩබ්.ජී.මිත්‍රසේන මයා, | ඩී 21 | සභාපති |
| 24 | ඒ.පී.වී.ජී.එස්.  ගමගේ මයා, | ඩී 24 | සභාපති |
| 25 | කේ.එම්.ජී. අබේරත්න මයා, | ඩී 25 | සභාපති |
| 26 | මල්ලිකා කුමාරි මිය, | ඩී 29 | සභාපති |
| 27 | ඒ.ජී.චන්ද්‍ර සේන මයා, | ඩී 30 | සභාපති |
| 28 | ජී.ටිකිරි බංඩා මයා | ඩී 31 | සභාපති |
| 29 | එච්.එම්. යසරත්න මයා, | ඩී 32 | සභාපති |
|  | එච්.ජී.ඇල්බට් | ඩී 34 | භාණ්ඩාගාරික |

3පියවර

| අඅ | නම | ගො. සං | තනතුර |
|---|---|---|---|
| 31 | ජී.ඒ.වී.සෙනෙවිරත්න | ඩි 35 | සභාපති |
| 32 | ඩබ්.ජී. නිමල් ප්‍රේමතිල මයා, | ඩි 42 | සභාපති |
| 33 | ඒ.එම්.ශාන්ත කුමාර | ඩි 47 | සභාපති |
| 34 | ජී.එම්.ජී.ගුණසේන මයා, | ඩි 51 | සභාපති |
| 35 | ආර්.කේ. චන්ද්‍රරත්න මයා, | ඩි 52 | සභාපති |
| 36 | ඩී.ජී. ලොකුබණ්ඩා මයා, | ඩි 56 | සභාපති |
| 37 | කේ.පී.ජී. උපාලි ජයතිස්ස මයා, | ඩි 57 | සභාපති |
| 38 | එස්.ර්. චන්ද්‍රලතා මිය, | දේවගිරිය | සභාපති |
| 39 | පි.ජී. ජයසිංහ මයා, | බෝගහවැව | සභාපති |
| 40 | එම්.එම්.එස්.බංඩාර මයා, | මාරකවැව | සභාපති |
| 41 | කේ.ජී.ප්‍රේමදාස මයා | රදුන්නවැව | සභාපති |
| 42 | ආර් එම් ආනන්ද රත්නායක මයා, | ගුරුවෙගයාය | සභාපති |

4පියවර

| අඅ | නම | ගො. සං | තනතුර |
|---|---|---|---|
| 43 | එස්.ඩබ්.එන්.ඩබ්. ජයරත්න මයා, | ඩි 2 | සභාපති |
| 44 | ර්.එම්.කුමාර සිංහ | ඩි 4 | සභාපති |
| 45 | ඩබ්.ජී. රංබණ්ඩා මයා, | ඩි 4 | සභාපති |
| 46 | ඒ.ජී.සමරකෝන් බණ්ඩා මයා | කරවුගහවැව 1 | සභාපති |
| 47 | එම්.ආර්.ජී.චන්ද්‍රසිරි, | ඩි 58 | සභාපති |